Australian Government

# MULTICULTURAL AUSTRALIA

United, Strong, Successful

— Australia's multicultural statement —

***බහුසංස්කෘතික ඔස්ට්‍රේලියාව – එක්සත්, ශක්තිමත් සහ සාර්ථක (Multicultural Australia – united, strong, successful)*** යනු ඉදිරි අවුරුදු සඳහා ප්‍රමුඛතා සහ උපායමාර්ගික දිසානති පිහිටුවන, බහුසංස්කෘතික ඔස්ට්‍රේලියාවකට යලි කැපවීම පිළිබඳ ආණ්ඩුවේ පොදු ප්‍රකාශනයයි .

# පෙරවදන

## ඔස්ට්‍රේලියානු අගමැති

ලෝකයේ වඩාත්ම සාර්ථක බහුසංස්කෘතික සමාජය ඔස්ට්‍රේලියාවයි.

මිහිපිට අඛණ්ඩව පැවතෙන මානව සංස්කෘතිය වන, අවුරුදු 50,000 කට අධික කාලයක් මේ රට රැකබලාගත්,  අපේ මුල් ඔස්ට්‍රේලියානුවන් (ආදිවාසීන්) තරමට අපි පැරැණ්නෝ වෙමු.

එමෙන්ම ලොව ඕනෑම රටකින්, ඕනෑම ආගමකින්, ඕනෑම ජාතියකින් පැමිණි සංක්‍රමික මවකගේ අතේ සිටින බිළිඳෙක් තරම් අපි යොවුන් වෙමු.

ඔස්ට්‍රේලියාව සංක්‍රමණික රටකි. අපේ වර්තමාන ජනගහනයෙන් අඩකට ආසන්න පිරිසක් එක්කෝ එතෙර ඉපදුන අයයි නැත්නම් ඔවුනට අඩුම ගනනේ එතෙර ඉපදුන එක් දෙමාපියෙක් සිටී.

අපි සෑම සංස්කෘතියකින්ම, සෑම ජාතියකින්ම, සෑම ආගමකින්ම, සෑම දේශයකින්ම පැමිණියෙමු.

අපව නිර්වචනය වන්නේ ජාතිය, ආගම හෝ සංස්කෘතිය මගින් නොව, නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය, නීතියේ ආධිපත්‍යය සහ සමාන අවස්ථා යන බෙදාහදාගත් සාරධර්ම මගිනි - සැමටම සාධාරන අවස්ථාවක් ලබාදීම (a “fair go”)

අපව එකට බැඳ තබන මැලියම අන්‍යෝන්‍ය ගෞරවයයි  එනම් අපි සෑම කෙනෙකුටම එක හා සමාන ගෞරවය, එක හා සමාන අභිමානය සහ එක හා සමාන අවස්ථා සඳහා අයිතියක් තිබේය යන දැඩි පිළිගැනීමයි.

එමෙන්ම අපේ නිදහස ගොඩනගා ඇත්තේ සහ පවත්වාගන යනුයේ දේශයේ ආරක්ෂාව - එනම් අපේ දේශය, අපේ ජනතාව සහ අපේ සාරධර්ම රැකගැනීමට ඇති ස්ථිර අධිෂ්ඨාණය  යන අත්තිවාරම මතය.

ගෝලීය ආතතිය වැඩෙමින්, අස්ථිරභාවය ඉහල යමින් තිබෙන වකවානුවක, ඔස්ට්‍රේලියාව සුසංගතබව, සමානාත්මතාවය සහ උත්සාහවන්ත බව සහ විවිධත්වය තුරුලුකරගත් දේශයකට නොසැලෙන උදාහරණයක් ලෙස සිටී.

*බහුසංස්කෘතික ඔස්ට්‍රේලියාව : එක්සත්, ශක්තිමත් සහ සාර්ථක* යන අපේ  ප්‍රකාශනය, වර්ගවාදය සහ විචයනයට ඉඩක් නැති බහුසංස්කෘතික ඔස්ට්‍රේලියාවක් කෙරෙහි ආණ්ඩුවේ ඇති කැපවීම අලුත් කරයි, යලි සහතික කරයි.

*බහුසංස්කෘතික ඔස්ට්‍රේලියාව : එක්සත්, ශක්තිමත් සහ සාර්ථක* යන අපේ  ප්‍රකාශනයට මම ප්‍රසංසා කරමි.



**ගරු මැල්කම් ටර්න්බුල් පාර්ලිමේන්තු මන්ත්‍රී**

ඔස්ට්‍රේලියානු අගමැති

# සමාජ සේවා ඇමති සහ සමාජ සේවා සහ බහුසංස්කෘතික කටයුතු පිළිබඳ සහාය ඇමති වරයාගේ ඒකාබද්ධ පණිවිඩය

අපේ ශක්තිමත් සහ සාර්ථක බහුසංස්කෘතික සමාජය ගැන ඔස්ට්‍රේලියානුවන් සියලු දෙනාටම ආඩම්බර වීමට පුළුවන. ඔස්ට්‍රේලියාවේ කතාව ඈත අතීතයේ ආදිවාසීන් සහ ටොරස් සමුද්‍ර සන්ධි දූපත් ඔස්ට්‍රේලියානුවන්ගෙන් පටන් ගෙන බ්‍රිතාන්‍ය සංස්ථාවන් ස්ථාපිත  කිරීම හරහා වර්ධනය වී සියලු දීප දේශ වලින් පැමිණෙන පුද්ගලයන්ගෙන් නොකඩවා ඉදිරියට යයි.

අප භුක්ති විදින නිදහස සහ ආරක්ෂාව අහම්බයක් නොවේ.  විවිධත්වය වැළඳ ගන්නා අතර අපේ සුවිශේෂ ජාතික අනන්‍යතාවය සහ සමෝධානය වූ එක්සත්  ප්‍රජාවක වැදගත්කම අවධාරණය කරන දැක්මක් අනුප්‍රාප්තීය ආණ්ඩු මගින් ස්ථාපිත කර ඇත.

ප්‍රජාතන්ත්‍රවාදය, අවස්ථා සහිත බව, සහ අපේ බෙදාහදාගත් සාරධර්ම පිළිබඳ අපේ ස්ථිර කැපවීම ගැන  යලි ප්‍රතිඥා වීමට, ත්‍රස්තවාදය සහ අන්තවාදය වැඩිවීම ගැන බොහෝ පුද්ගලයන් කාංසාසහගතව සිටින මේ  වකවානුවට වඩා හොඳ කාලයක් තවත් නැත.

අපේ දේශයේ ආරක්ෂාව සහ අපේ ජනතාවගේ නිදහස ගැන ඔස්ට්‍රේලියානු ආණ්ඩුව කැපවී සිටී.  පෙරදී අපව  සාර්ථකත්වය කරා ගෙන ගිය සහ ඉදිරියේදී සමෘද්ධිය කරා අපව ගෙන යාමට උපකාරී වන සාරධර්ම, *බහුසංස්කෘතික ඔස්ට්‍රේලියාව : එක්සත්, ශක්තිමත් සහ සාර්ථක* යන අපේ  ප්‍රකාශනයේ ආණ්ඩුව විසින්  දක්වා ඇත.

සංස්කෘතික විවිධත්වය අපේ එක් ශ්‍රේෂ්ඨතම ශක්තියක් බව මේ ප්‍රකාශනයෙන් පිළිගැනේ . එනම් සෑම දෙනාම අයිතිබව සහ සෑම දෙනාටම ශ්‍රේෂ්ඨ ජීවිතයක් ගතකිරීමට අවස්ථාව උදාකර දෙන අනාගතයක් ගොඩනගා ගැනීමට අපට ඉඩ සලසන ශක්තියයි. එය අපේ ප්‍රජාතන්ත්‍රවාදී සංස්ථාවන්හි සහ නීතියේ ආධිපත්‍යයෙහි කේන්ද්‍රීයබව අනුමත කරයි. එය අපේ දේශීය අනන්‍යතාවය සඳහා අපේ පුරවැසිකමේ ඇති වැදගත්කම අවධානයට ලක් කරයි. එමෙන්ම, අපේ සහෝදර ඔස්ට්‍රේලියානුවන්ට ගෞරවණිය වීමට අපට ඇති වගකීම එයින් පැහැදිලි කරයි.

අපේ බහුසංස්කෘතික සමාජය තවදුරටත් ගොඩනැංවීමට අපට හැකිකම ලබාදෙන පදනම මේ ප්‍රකාශනයයි. නිදහස සහ සමෘද්ධිය කරා යන විඩා නැති ව්‍යායාමයේදී සියලුම ඔස්ට්‍රේලියානුවන් සමග එකට කටයුතු කිරීමට අපි බලාපොරොත්තු වෙන්නෙමු.



**ගරු ක්‍රිස්ටියන් පෝටර් පාර්ලිමේන්තු මන්ත්‍රී**

සමාජ සේවා ඇමති



**ගරු සෙඩ් සෙසෙල්ජා සෙනෙට් සාමාජික**

සමාජ සේවා සහ බහුසංස්කෘතික කටයුතු පිළිබඳ සහාය ඇමති

## බහුසංස්කෘතික ඔස්ට්‍රේලියාව : එක්සත්, ශක්තිමත් සහ සාර්ථක

### අපේ බෙදාහදා ගත් කතාන්දරය

සංස්කෘතීන්, අත්දැකීම්, විශ්වාස සහ සම්ප්‍රදායන් රැසියක් එක්සත් කරන ලෝකයේ වඩාත්ම සාර්ථක බහුසංස්කෘතික සමාජය ඔස්ට්‍රේලියාවයි. අපේ සාර්ථකත්වයට ආදිවාසී මුල් ඔස්ට්‍රේලියානුවන්ගේ පටන් අලුතෙන්ම පැමිණියවුන් දක්වා, 300කට වැඩි විවිධ පෙළපත් ගණනාවක් විසින් කරන ලද සම්මාදමට අපි ණයගැති වෙමු.

අපේ සශ්‍රීකභාවයට එක් හේතුවක්වූ නිදහස, ආරක්ෂිතබව සහ සමෘද්ධිය සඳහා වන පොදු සාරධර්ම සහ කැපවීමට උර දෙන අපේ සංසාකෘතික විවිධත්වයට ස්තුතිපූර්වක විය යුතුය.

මිහිතලයේ පැරණිම සජීවී සංස්කෘතිය වන ආදිවාසී සහ ටොරස් සමුද්‍ර සන්ධි දූපත් ජනයා සහ මෙහි නව දිවියක් ගතකිරීමට තෝරාගත් මිලියන ගණනක ජනතාව නිසා අපේ දේශය පෝෂණය වී ඇත.

අපි අද ඔස්ට්‍රේලියාව ලෙස නම් කරණ භූමියේ අවුරුදු 50,000කට අධික කාලයක් තිස්සේ මුල් ඔස්ට්‍රේලියානුවන් ජීවත් වෙමින්, ඉගනගනිමින් , අනුවර්තනය වෙමින් නොනැසී සිටියහ. උරුනුර ජීවත්වූ මොවුහු එකිනෙකාට සුවිශේෂ සංස්කෘතීන්, විශ්වාස සහ උපභාෂා සහිතවූ මහාද්වීපය පුරා පැතිර සිටි වෙන වෙනස් භාෂා සමූහ හෝ ‘ජාතීන්’ 250කට වැඩි ගණනකින් සමන්විත විය. මේ ජාතීන්ගෙන් පැවතෙන්නවුන් මිහිපිට පැරණිම සජීවී සංස්කෘතිය වන අතර අන් කිසි ජනතාවකගේ මතකයෙන් ඔබ්බට යන, කාලය සහ අවකාශය පිළිබඳ කාතාන්දර ඔවුන් සතුව ඇත.

නූතන ඔස්ට්‍රේලියාවේ ස්ථාපනයත් සමග, බ්‍රිතාන්‍ය සහ අයර්ලන්ත ජාතික ජානාවාස පිහිටුවීම, සහ අපේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය, සංස්ථා සහ නීතිය ස්ථාපනය හරහා මේ කාතාන්දරය නොකඩවා පවත්වාගන යන ලදී. සෑම මහාද්වීපයකින්ම පැමිණ ඔස්ට්‍රේලියාව තම නිවහන කරගත් මිලියන ගණනක් ජනයා ඇතුලත්ව, කාලයත් සමග අපේ කතාන්දරය වර්ධනය විය.

අපේ නිදහස් සහ විවෘත සමාජයේ කොටසක් වීමට, තම ජීවිතය ගොඩනගා ගැනීමට සහ අපේ දේශයට සම්මාදමක් කිරීමට මෙහි සංක්‍රමණය වුවන්ව ඔස්ට්‍රේලියානුන් අද සාදරයෙන් පිළිගනී.

කාලයත් සමග මෙම මිනිස් එක්වීම අපේ යටිතල ගොඩනැංවීමටත්, අපේ ප්‍රජාවන් ප්‍රබෝධමත් කිරීමටත්, අපේ සංස්කෘතික අත්දැකීම් විපුලිත කිරීමටත්, අතිශයින්ම වැදගත් ලෙස, අපි ලෝකය දෙස බලන අන්දම සහ ඒ සමග අනුබද්ධ වන අන්දම පුළුල් කිරීමටත් උපකාරී විය. රජය, ප්‍රජාව සහ පුද්ගලයා (ජාතිකත්වය නොසළකා) අතර අන්‍යෝන්‍ය වගකීම් ගොඩනැංවීම අපේ ප්‍රත්‍යස්ථිතිය සහ අයත්භාවය පිළිබඳ හැඟීම ශක්තිමත් කරයි.

සැවොම එක්ව අපේ බෙදාහදාගත් සාරධර්ම, අයිතිවාසිකම් සහ වගකීම් සහිත නූතන සහ සමෘද්ධිමත් වර්තමාන ඔස්ට්‍රේලියාව අපි ගෙඩනැංවුවෙමු.

**අපේ බෙදාහදාගත් සාරධර්ම**

අපේ සාරධර්ම අපව එක්සත් කර අප අතර සමාජයීය බැඳීම් ඉදි කරයි. එමගින් අප සමාජයේ අත්තිවාරම සහ සැවොම ඇතුලත් වූ බෙදාහදාගත් අනාගතයක් ලබා දෙයි. අපේ සාරධර්ම පාදක වන්නේ:

***ගෞරවය***

අපි නීතියේ ආධිපත්‍යයට සහ ඔස්ට්‍රේලියාවට පක්ෂපාත බවට ගරු කරමු, කැප වෙමු.

නිදහසට සහ සෑම පුද්ගලයෙකුගේම අභිමානයට අපි ගරු කරන්නෙමු.

අපේ විවිධත්වය අප අගය කරණ අතරම අන්‍යෝන්‍ය ගෞරවය, ඇතුලත්භාවය, සාධාරනත්වය සහ කාරුණිකභාවය වැළඳ ගන්නෙමු.

***සමානත්වය***

අපි පිරිමින් සහ කාන්තාවන් අතර සමානත්වයට සහයෝගය දෙමු.

අපි නීතිය ඉදිරියේ සමානත්වය ගැන විශ්වාස කරන්නෙමු.

අපි සෑම දෙනාටම සම අවස්ථා තිබීම ගැන විශ්වාස කරන්නෙමු.

***නිදහස***

නිදහස කෙරෙහි අප තුල ඇති කැපවීම මූලික ප්‍රතිපත්තියකි.

සිතීමේ, කතා කිරීමේ, ආගම ඇදහීමේ, ව්‍යවසායේ සහ සබඳතා පැවැත්වීමේ නිදහසට අපි සහයෝග දෙමු.

පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයට අප කැපවී සිටිමු.

අපේ පුරවැසි යුතුකම් ඉටු කිරීමේ වගකීම අපි බාරගන්නෙමු.

අපේ සාරධර්ම වලට හානි පමුණුවන පුරුදු සහ හැසිරීම් වලට ඔස්ට්‍රේලියාවේ ඉඩක් නැත.

අපි සියල්ලෝ අපේ දේශයේ ආර්ථික සාර්ථකභාවය, සංස්කෘතික සහ ආගමික නිදහස, සහ විවිධත්වයෙන් ප්‍රතිලාභ ලබන්නෙමු. අපේ පොදු සාරධර්ම කෙරෙහි ප්‍රබල කැපවීමක් පවත්වාගන යාම ඔස්ට්‍රේලියානු ජනතාවගේ යහපතට හේතුවේ.

**බෙදාහදාගත් අයිතිවාසිකම් සහ වගකීම්**

අන්‍යෝන්‍ය ගෞරවය සහ අන්‍යෝන්‍ය වගකීම අපි පිළිගන්නෙමු. බහුසංස්කෘතික සමාජයක් ලෙසට අපේ සාර්ථකභාවයට හේතුව, අපේ සමෘද්ධියට සම්මාදම් කිරීමට සහ එයින් ප්‍රයෝජන ලබා ගැනීමට සෑමදෙනාටම අවස්ථාවක් ලබාදීම අරමුණු කරගත් ස්ථාවර, ප්‍රත්‍යස්ථිතික සහ සුසංගත බව සහතික කරණු ලබන අයිවාසිකම් සහ වගකීම් අතර සමතුලනයක් තිබීමයි.

අපේ සමාජය, සෑම පුද්ගලයෙකුගේම මූලික අයිතිවාසිකම් අනුල්ලංඝනීය වන ලිබරල්-ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදාය මත ගොඩනැගුනු සමාජයකි.

පුරවැසිභාවය වරප්‍රසාදයකි. ඔස්ට්‍රේලියානු පුරවැසි උත්සවයේ අංගයක් ලෙස අලුත් පුරවැසියන් මෙලෙස ප්‍රතිඥා දී සහතික කරනු ලැබේ : '*ඔස්ට්‍රේලියාවට සහ ඇගේ ජනතාවට පක්ෂපාති වෙමි. ඔස්ට්‍රේලියාවේ සහ ඇගේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී විශ්වාසයන් මම බෙදාහදා ගන්නෙමි, අයිතිවාසිකම් සහ නිදහස් වලට මම ගරු කරන්නෙමි, මම නීති අනුමත කරමි, පිළිපදිමි*'.
අපේ රටේ සිටින සියලු දෙනාම. ඔවුන් ඔස්ට්‍රේලියානු පුරවැසියන් වුවද නොවුවද, ඔස්ට්‍රේලියානු නීතියට අවනත වෙතැයිද, අපේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියා පද්ධතියට සහාය වෙතැයිද, සියලු දෙනාටම ගෞරවනීය සහ අභිමානාත්මක ලෙස සළකණු ඇතැයිද ඔස්ට්‍රේලියානුවන් සාධාරන ලෙස බලාපොරොත්තු වේ.

**සුරක්ෂිත සහ විශ්වාසදායක ඔස්ට්‍රේලියාවක්**

විවිධත්වය සහ සුසංගතභාවයෙන් යුත් ඔස්ට්‍රේලියාවකට යටිතලවුරුව වනුයේ රටේ ආරක්ෂාවයි. සියලුම ඔස්ට්‍රේලියානුවන්ගේ ආරක්ෂාව පිළිබඳව ඔස්ට්‍රේලියානු ආණ්ඩුව තම ඉහලම ප්‍රමුඛත්වය දෙයි. මෑතදී ලොව වටා සිදුවූ ත්‍රස්තවාදී ප්‍රහාර ඔස්ට්‍රේලියානු ප්‍රජාව තුල සාධාරන කනස්සල්ලක් හටගැනීමට හේතු විය.

ප්‍රති-ත්‍රස්තවාදය, ශක්තිමත් දේශසීමා, සහ ශක්තිමත් ජාතික ආරක්ෂාව සඳහා නොකඩවා ආයෝජනය කිරීම මගින් ආණ්ඩුව මෙම තර්ජන වලට ප්‍රතිචාර දක්වයි. ඔස්ට්‍රේලියාව විවෘත, සෑම දෙනාම ඇතුලත්, නිදහස් සහ සුරක්ෂිත සමාජයක් ලෙස පැවැත්ම සහතික කිරීමට මෙය උපකාරී වේ.

එහෙත්,මෙම තර්ජන හමුවේ අපි අපේ බෙදාහදාගත් සාරධර්ම සහ ජාතික සමගිය සම්මුති නොකරන්නෙමු. ඔස්ට්‍රේලියානු ප්‍රජාවේ ආරක්ෂාව සවිගැන්විය හැකි හොඳම මග , අපිව එක්සත් කරන්නේ කවර දේ වලින්ද යන්න ගැන අවධානය යොමු කිරීමෙන් සහ අපේ වෙනස්කම් කෙරෙහි අන්‍යෝන්‍ය ගෞරවය තුලින් බව රජය සහතික ලෙස පවසා සිටී.

**අනාගතය සඳහා බෙදාහදාගත් දැක්මක්**

ඔස්ට්‍රේලියාව එක්සත් වී ඇත්තේ අපේ දේශය සහ අපේ ප්‍රජාතන්ත්‍රවාදී සංස්ථාවන් සහ සාරධර්ම කෙරෙහි අපේ බෙදාහදාගත් කැපවීම නිසාය. අපේ සමාජය දිගටම ආරක්ෂිත, සංසක්ත සහ සුසංගත ලෙස පවත්වාගන යාම සඳහා, අපි සැමොම පිළිගැනීම සහ අවබෝධය ප්‍රවර්ධනය කරන ලෙස දිරිගන්වන්නෙමු.

අන්‍යෝන්‍ය ගෞරවය පිලිබඳ මූලධර්මය ප්‍රවර්ධනය කිරීමත්, ජාතිවාදී වෛරය සහ විචයනය ඔස්ට්‍රේලියානු සමාජයට නොගැළපෙන දෙවල් ලෙස හෙළා දැකීමත් අණ්ඩුව මෙම ප්‍රකාශනය තුල නොනවත්වා කරගන යයි

අපේ එක්සත්භාවය උත්පාදනය, සහාය සහ පෝෂණය කරන අනෙකුත් රජයේ ප්‍රතිපත්ති සහ වැඩසටහන් මෙන්ම අනේකවිධ ප්‍රජා සහ ස්වේච්ඡා ක්‍රියාකාරකම් මේ ප්‍රකාශනය මගින් අනුපූරණය කරයි. උදාහරණ:

- වැඩිහිටි සංක්‍රමික ඉංග්‍රීසි වැඩසටහන (Adult Migrant English Program) මගින් සුදුසුකම් ලත් සංක්‍රමණිකයන් සහ මානවහිතවාදී ප්‍රවිෂ්ටයන්ට ඔස්ට්‍රේලියානු සමාජයට සමාජයීය සහ ආර්ථික වශයෙන් සහභාගි වීමට හැකි වනු පිණිස ප්‍රාරම්භක ඉංග්‍රීසි භාෂාව සහ ජදිංචිවීමේ කුසලතා ඉගෙනීමට උපකාර කරණු ලැබේ.

- රජයේ බහුසංස්කෘතික පිවිසුම සහ සහසාධාරණතාවය පිලිවෙත (Government's Multicultural Access and Equity Policy) මගින්, වැඩසටහන් සහ සේවාවන් සෑම ඔස්ට්‍රේලියානුවන්ගේම (ඔවුන්ගේ සංස්කෘතික සහ භාෂා පසුබිම කුමක් වුවද) අවශ්‍යතා පිරිමසන බව සහතික කිරීමට කටයුතු කරණු ලැබේ.

- පුරවැසිභාවය කරා ගමන්මග මගින් අලුත් සංක්‍රමණිකයන්ට ප්‍රජා සමාජයේ පූර්ණ සහ ක්‍රියාකාරී සහභාගිවන්නන් බවට පත්වීමට අවස්ථාව සළසා දෙනු ලැබේ.

- ගුවන් විදුලිය, මුද්‍රණ, මාර්ගස්ථ සහ රූපවාහිණිය මගින් ආණ්ඩුව ශක්තිමත් බහුසංස්කෘතික මාධ්‍ය සඳහා ආධාර දෙනු ලැබේ.

- 1999 වසරේදී ස්ථාපනය කල සුසංගත දිනය (Harmony Day), සැමටම ඇතුළත්කම, ගෞරවණීයභාවය සහ අයත්කම පිළිබඳ පණිවිඩය පතුරවමින්, දැන් දහස් ගණන් ඔස්ට්‍රේලියානුවන් උත්සවාකාරයෙන් සමරණු ලැබේ.

- ඔස්ට්‍රේලියානු බහුසංස්කෘතික කවුන්සලය (Australian Multicultural Council) රජයට සවිමත් සහ ස්වාධීන උපදෙස් සපයන ප්‍රධාන උපදේශක ආයතනයක් ලෙස කටයුතු කරයි.

අපේ සුසංගතබව සහ සමෘද්ධිය ඉබේ පහළවූ දෙයක් ලෙස ඔස්ට්‍රේලියානුන් නොසළකයි. අපේ බෙදාහදාගත් සාරධර්ම වල මගපෙන්වීම තුලින්, උපායමාර්ගික දිසානතීන් අනුගමනය කරමින්, පුද්ගලයන් සහ කණ්ඩායම් ලෙස, සහ රජයේ සැම මට්ටමකම එකට එක්වී අපි ශක්තිමත්, වඩා සංසක්ත සහ සමෘද්ධිමත් ප්‍රජාවක් නොනවත්වා ගොඩනංවන්නෙමු.

## නව ප්‍රවිෂ්ටයන්ගේ සමාජයීය සහ ආර්ථික සහභාගිත්වය උනන්දුකරවීම

අපේ සමාජ සහ ආර්ථික රටාවට සංක්‍රමණිකයන් විසින් සම්මාදම් වීමේ සාරවත් ඉතිහාසයක් ඔස්ට්‍රේලියාවට ඇත. අපේ සියල්ලන් ඇතුලත් බහුසංස්කෘතික සමාජය අලුත් සංක්‍රමණිකයන්ට අපේ දේශයේ සාර්ථකභාවයට සම්මාදම් කිරීමට අවස්ථා සළසා දෙයි.

ප්‍රජාවන්, පාසල්, ලාභ නොලබන සංවිධාන, ආගම් පාදක සංවිධාන, සේවා යෝජකයන් සහ ආණ්ඩු වල පරිශ්‍රමයන් එකතුව, ඔස්ට්‍රේලියානු සමාජයට ධනාත්මකව සම්මාදම් කිරීමට පුද්ගලයන්ට අවස්ථාව සළසා දේ.

ඔස්ට්‍රේලියාවට සංක්‍රමණය වන්නෝ අලුත් අවස්ථා හෝ වඩා යහපත් ජිවිතයක් සෙවීමේ කාර්යය බෙදාහදා ගනී.

ඒ අතරම, අලුත් සංක්‍රමණිකයන් සහ ඔවුන්ගේ පවුල් වල ආර්ථික සහ සමාජයීය අනුකලනය ඔවුන්ගේ අනාගතයට අත්‍යවශ්‍ය වේ. ඔවුන් නව නිවහනට සම්බන්ධය සහ ඔස්ට්‍රේලියානු සමාජයේ කොටසක්ය යන හැඟීම තමන් ගේ වටිනාකම සහ අයත්කම පිළිබඳ සංජානනයක් ඇති කරයි.

අලුත් සංක්‍රමිකයන්ට ඔස්ට්‍රේලියානු ජීවිතයට අනුකලනය වීම සඳහා සැකසුනු පදිංචිය පිළිබඳ රාමුවක් ආණ්ඩුව සපයා දෙයි. මේ රාමුව ප්‍රශස්ත ව්‍යවහාරය ලෙස බොහෝ දෙනා පිලිගනී. පදිංචිවීම පිළිබඳ වැඩසටහන් මගින් සංක්‍රමිකයන්ට ස්වශක්තිය ලබාගැනීමට සහ ඔස්ට්‍රේලියානු ප්‍රජාවේ ක්‍රියාකාරී සාමාජිකයන් වීමට ආධාර දෙයි.

අලුත පැමිණියන් සමහරක්, විශේෂයෙන්ම ඔස්ට්‍රේලියානු සරණාගත සහ මානවහිතවාදී වැඩසටහන යටතේ පැමිණියන්, විශේෂ ආධාර වලින් ප්‍රයෝජනය ලබති. ඉංග්‍රීසි භාෂාව ඉගෙනීමට සහ අවශ්‍ය අධ්‍යාපන හෝ රැකියා කුසළතා ලබාගැනීම සඳහා වන ආධාර මීට අයත් වේ. මානවහිතවාදී ප්‍රවිශ්ටයන්ට, විශේෂයෙන්ම ඔවුන් ඔස්ට්‍රේලියාවට පැමිණ මුල් අවුරුදු පහ ඇතුළත, යහපත් ජීවිතයක් ගොඩනගාගන ස්වයං පෝෂිතව සමාජයට පූර්ණව සම්මාදම් කරන සාමාජිකයන් වීමට ආධාර වීමට ආණ්ඩුව කැපවී සිටී. මානවහිතවාදී ප්‍රවිශ්ටයන්ට වැඩිදියුණු කළ ඉංග්‍රීසි භාෂා, අධ්‍යාපන සහ රැකියා ප්‍රතිඵල ලබාදීම පිණිස, ඔස්ට්‍රේලියානු රජය දැනට පදිංචිවීමේ සේවා ප්‍රතිසංස්කරණය කිරීමේ නියැලී සිටී.

## අපේ විවිධත්වයෙන් සහ බෙදාහදාගත් ජාතික ඇලුම්වලින් වාසි ලබා ගැනීම

දැනටත් ඉදිරියටත් ඉංග්‍රීසි අපේ රාජ්‍ය භාෂාවයි. සංක්‍රමිකයන්ගේ අනුකලනය පිනිස එය තීරණාත්මක මෙවලමකි. ඒ අතරම අපේ බහුභාෂික ශ්‍රම බලකාය මගින් ව්‍යාපාර සීමාවන් පුළුල් කරණු ලබන අතරම තදින් ගෝලීයකරණය වන ආර්ථිකයක ඔස්ට්‍රේලියාවේ තරඟකාරී බව වැඩි දියුණු කරයි.

අපේ සංස්කෘතික විවිධත්වය අපේ එක් ශ්‍රේෂ්ඨතම ශක්තියකි – එමගින් නවෝත්පාදනය, නිර්මාණශීලිත්වය සහ ජෛවය පුලිඟු ගන්වයි. අපේ බහුවිධ ශ්‍රම බලකායේ නිපුණතා, දැනුම, භාෂා හැකියාවන් , ජාල සහ නිර්මාණශීලිත්වය මගින් අපේ ආර්ථිකය ශක්තිමත් කෙරේ. අන්තර්ජාතික ආර්ථික ඉඩ ප්‍රස්ථා හඳුනාගැනීමට සහ ග්‍රහණය කරගැනීමට අපට ඇති හැකියාව තුලින් අපේ ඵලදායීතාව සහ තරගකාරීබව වර්ධිත වේ.

ඔස්ට්‍රේලියානු සමාජයට සහ ආර්ථිකයට මෙහි සිටින අතරතුර සම්මාදම් කරන අප්‍රමාණ තාවකාලික සංක්‍රමිකයන්ගේ දක්ෂතා මීට අයත් වේ. බොහෝ දෙනෙක් ඔස්ට්‍රේලියාවේ නිත්‍ය පදිංචිකරුවන් වේ. සමහරෙක් තම උපන් රටට ආපසු යාම හෝ වෙන රටකට යාම කරති. මේ මගින් අපේ විදේශීය සංස්කෘතික, වෙළඳ සහ ආර්ථික ඉඩ ප්‍රස්ථා තවදුරටත් ශක්තිමත් කෙරේ.

අපේ බහුවිධ ශ්‍රම බලකායේ ප්‍රතිලාභ ප්‍රවර්ධනය සහ උපරිම කිරීමේදී රජය, ව්‍යාපාර සහ කර්මාන්ත යන සියල්ලොම කාර්යභාරයක් සපුරයි.

## සුසංගත සහ සමාජයීයව සංසක්ත ප්‍රජාවන් නොකඩවා ගොඩනැංවීම

අප හවුලේ බෙදාගත් ඔස්ට්‍රේලියානු සාරධර්ම අපේ ආර්ථික සමෘද්ධියේ මෙන්ම සමාජයීයව සංසක්ත සමාජයේ මුල්ගලයි.

අපේ සංස්කෘතික උරුමය හවුලේ බෙදාගැනීම, ඔස්ට්‍රේලියානු වීමේ අරුත ගැන උත්සව පැවැත්වීමේ සහ සැමදෙනාටම අපේ සමාජයට තමන් අයිතිය යන හැඟීම ඇති කිරීමට උපකාරී වීමේ අංගයකි. ප්‍රජා සුසංගතිය ජාතික සමගිය ගොඩනගයි. පොදු අත්දැකීම් මගින් හවුලේ බෙදාගත් ඉතිහාස නිමවයි, හවුලේ බෙදාගත් අනාගතයන් හැඩගස්වයි.

ප්‍රතිවිරුද්ධ වශයෙන්, වර්ගවාදය සහ විචයනය අපේ සමාජයට අනතුරු පමුණුවයි. වාර්ගික වෛරය අවුස්සන පුද්ගලයන්ව අපි හෙළා දකින්නෙමු.

ප්‍රජාවන් තුල ආතතිය ඇතිවීමේ ඉඩකඩ අඩු කිරීමට සහ සුසංගතිය සහ සංසක්තතාවය ශක්තිමත් කිරීම පිණිස සවිධි අන්තර්-ආගමික සහ අන්තර්-සංස්කෘතික කතිකාවත් තීරණාත්මක වේ. එවැනි කතිකා පූර්ව විනිශ්චය අඩු කිරීමටත්, සංස්කෘතීන් හරහා අවබෝධය ප්‍රවර්ධනය කිරීමටත්, වෙන වෙනත් ජනවාර්ගික සහ ආගමික කණ්ඩායම් අතර සබඳතා වැඩිදියුණු කිරීමටත්, අයත්භාවය පිළිබඳ හැඟීම සහ විශ්වාසය වර්ධනය කිරීමටත් උපකාරී වේ.

සංස්කෘතික පසුබිම, උපන් ස්ථානය හෝ ආගම කුමක් වුවද, ඔස්ට්‍රේලියාවේ සිටින හෝ ඔස්ට්‍රේලියාවට පැමිණෙන සෑම කෙනෙකුටම, එකිනෙකා සමග සම්බන්ධ වීමට, එකිනෙකා අවබෝධ කරගැනීමට සහ සෑම අකාරයකම වර්ගවාදය සහ ප්‍රචණ්ඩ අන්තවාදය ප්‍රතික්ෂේප කිරීමට වගකීමක් ඇත.

### නිගමනය

අනුප්‍රාප්තීය ඔස්ට්‍රේලියානු ආණ්ඩු විසින් බහුසංස්කෘතික ඔස්ට්‍රේලියාවක් සඳහා ස්ථිර කැපවීමක් පිහිටුවා ඇත. මේ අලුත් ප්‍රකාශනය තුලින් රජයේ කැපවීම නවීකරණය කිරීම සහ යලි ප්‍රතිඥා කිරීම කාලෝචිත වේ. මෙය අපේ සමාජය යටිතලවුරු කරන ඇගයුම් සහ වගකීම් පිළිබඳව, අපේ ජාතික ඇලුම් වලට සහාය දෙන සහ අභියෝග වලට අපි ප්‍රතිචාර දක්වන අන්දම ගැන මග පෙන්වන පැහැදිලි පණිවිඩයක්වේ. ඔස්ට්‍රේලියාවට අප දක්වන පක්ෂපාතභාවයෙන් එක්සත්වූ, නිදහස සහ සමෘද්ධිය ගැන කැපවුනු, ශක්තිමත් සහ සාර්ථක බහුසංස්කෘතික රටක් ලෙසට අපේ අනාගතය ගැන දැක්මක් එයින් පිළිබිඹු කරයි.